## ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.
## දෙවන වාර පරීක්ෂණය - 2015
### 6 ශ්‍රේණිය
### ඉතිහාසය

කාලය පැය 2 යි.

නම: ................................................................................ අංකය:- ................ පන්තිය:- ..........

## I - කොටස

**සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01) සිතියමට අවධානය යොමු කරමින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




1) සිතියමේ අංක වලට අනුව ශිෂ්ඨාචාර නම් කරන්න.

i) .................................... ii) ....................................

2) 1 වන අංකයෙන් පිහිටා තිබෙන ශිෂ්ඨාචාරයට අදාල ප්‍රධාන ගොඩනැගිල්ල නම් කරන්න.

i) .................................... ii) ....................................

3) 3 වන අංකයෙන් දක්වා ඇති ශිෂ්ඨාචාරයට අදාල ප්‍රධාන නගර 2 නම් කරන්න.

i) .................................... ii) ....................................

4) අංක 2 න් දක්වා ඇති ශිෂ්ඨාචාරයට අදාල අක්ෂර පද්ධතියට අදාල කරුණු 2 සඳහන් කරන්න.

i) .................................... ii) ....................................

5) අංක 3 න් දක්වා ඇති ශිෂ්ඨාචාරයට අදාලව නගර සැලැස්ම පිළිබඳව කරුණු 2 ලියන්න.

i) .................................... ii) ....................................

6) 2 වන අංකයට අදාලව පිහිටි ශිෂ්ඨාචාරයේ මමි කරණය හඳුන්වන්න.

................................................................................

(ලකුණු 14)

02) නිවැරදි පිළිතුරේ අංකය වරහන් තුළ යොදන්න.

7) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඉවහල් වන සාහිත්‍ය මූලාශ්‍රයක් වන්නේ,

i) කාසි වර්ග  iii) නටබුන්
ii) ගොඩනැගිලි  iv) මහ වංශය

8) ඉන්දියාවේ බටහිර ප්‍රදේශය පාලනය කල ගෞතමී පුත්‍ර සාතකර්ණි රජු ශකවරුන් පරදා එම ප්‍රදේශය ජය ගන්නේ,

i) ක්‍රි.ව. 78  iii) ක්‍රි.පූ. 236
ii) ක්‍රි.ව. 622  iv) ක්‍රි.පූ. 544

9) යක්ෂ ගෝත්‍රිකයන් ජිවත් වූ නගර දෙක වන්නේ,

i) නාගදීපය හා කැලණිය  iii) ලංකාපුර හා සිරිසවස්ථුව
ii) කෝට්ටේ හා ගම්පොල  iv) කුරුණෑගල හා යාපහුව

(ලකුණු 6)

- **හිස්තැන් පුරවන්න.**

10) විජය කුමරු ලංකාවට ගොඩබසින විට මෙරට රජකල ජන කාණ්ඩයට වන්නේ ..........................................

11) මෙම පිරිස ගොඩ බසින ලද ස්ථානය වන්නේ ..................................

12) කඳුකර ප්‍රදේශ වල තැනිතලා බිම් හඳුන්වන්නේ .......................... නමිනි.

(ලකුණු 6)

- **හිස්තැන් පුරවන්න. (වගුව ආශ්‍රිත)**

| | | |
|---|---|---|
| 13) | මල්වතු ඔය ආශ්‍රිතව ඇති කල ජනාවාසය | |
| 14) | විජය කුමරු ඉන්දියාවෙන් කුමරියක් හා විවාහ වීම ඇයගේ දේශය | |
| 15) | කුවේනිය හා විජයගේ දරුවන් දෙදෙනාගෙන් කෙනෙකි. | |
| 16) | ලෝකයේ පැරණිතම නිති පොත වන්නේ | |
| 17) | චීන ශිෂ්ඨාචාරයේ ජනයා නිපදවන ලදි. | |
| 18) | මෙසපොතේමියානු ශිෂ්ඨාචාරය පාලනය කල පාලකයා | |

| | |
|---|---|
| | වංගදේශය |
| උරුවෙලගාම | පාණ්ඩය දේශය |
| උපතිස්ස ගාම | පාරාවෝ නම් පාලකයා |
| මාහ ගාම | හමුරාබි ලේඛනය |
| ජිවහත්ත | වෙඩිබෙහෙත් |
| මිත්තා කුමරිය | ලෝකඩ නිර්මාණය |
| | පාමුරාබි නම් පාලකයා |

(ලකුණු 10)

• රූප සටහන් හඳුනාගෙන කුමන ශිෂ්ටාචාරයට අයත් දැයි රූප සටහනේ ඉදිරියෙන් ලියන්න.

19)



........................................................................

20)



........................................................................

The National e-learning Portal for The General Education

21)



........................................................................

22)



........................................................................

(1×4)

## II - කොටස

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01) i) ඉතිහාසය යනු කුමක් ද? (ලකුණු 2)

ii) ඉතිහාසය ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන 4 ක් ලියන්න. (ලකුණු 4)

iii) ඔබේ පවුලේ ඉතිහාසය ගැන තොරතුරු දැනගත හැකි පුරාවිද්‍යා මූලාශ්‍ර පිළිබඳව කෙටියෙන් ලියන්න. (ලකුණු 5)

02) i) ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස කාලයේ දඩයමින් මෙන්ම තැනින් තැන ඇවිද ආහාර සොයා ගන්නා ලදී. ඒ අනුව ඔවුන් ලබාගත් ආහාර පිළිබඳව කෙටියෙන් ලියන්න. (ලකුණු 2)

ii) ගොවිතැන ආරම්භ වීම සමග මිනිසාගේ සොයා ගැනීම් හා ජිවත් වූ ආකාර 4 ක් ලියන්න. (ලකුණු 4)

iii) මිනිසා ගොවිතැනට හුරුවුන පසු වඩා දියුණු තත්ත්වයකට පත් විය. ඒ අනුව මියගිය තම නෑදෑයන්ට ගෞරව කල ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 5)

03) i) විජය රජුගේ මව හා පියා නම් කරන්න. (ලකුණු 2)

ii) විජය කුමරුට සිය මව්රටින් පිටවීමට සිදුවුනේ ඇයි? (ලකුණු 4)

iii) විජය කුමරු සමග පැමිණි පිරිස ජනාවාස පිහිටුවා ගැනීමට ගංගා නිම්න තෝරා ගත්තේ ඇයි? කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

04) i) ශිෂ්ඨාචාරයක් යනු කුමක් ද? (ලකුණු 2)

ii) ශිෂ්ඨාචාරයක ලක්‍ෂණ 4 ක් ලියන්න. (ලකුණු 4)

iii) අතීතයේ පැවති ගමක හා නගරයක වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 5)

05) i) පළමුව ගින්දර භාවිතා කල මානවයා නම් කරන්න. (ලකුණු 2)

ii) හොමෝ සාපියන් මානවයාගේ දක්‍ෂතා 4 ක් නම් කරන්න. (ලකුණු 4)

iii) පෘතුවියේ බිහිවීම පිළිදව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5)

06) i) මෙසපොතේමියානු ශිෂ්ඨාචාරයට අදාලව ඇදුම් හා ආභරණ පැලදීම පිළිබද විශේෂ ලක්‍ෂණ දෙකක් ලියන්න. (ලකුණු 2)

ii) ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයෙන් ලොවට ලද දායාද මොනවා ද? (ලකුණු 4)

iii) නයිල් නිම්න ශිෂ්ඨාචාරයේ ආර්ථික කටයුතු කෙටියෙන් ලියන්න. (ලකුණු 5)

07) i) පාසලේ ඉතිහාසය ඉගෙනීමට උදව්කරගත හැකි මූලාශ්‍ර 2 ක් ලියන්න. (ලකුණු 2)

ii) පාසලේ ඉතිහාසය ගැන කරුණු 4 ක් ලියන්න. (ලකුණු 4)

iii) ඔබ අනුරාධපුර හෝ පොළොන්නරු නගර වල සංචාරය කරන විට ලංකාවේ ඉතිහාසය පිළිබඳව ලබාගත හැකි තොරතුරු කෙටියෙන් ලියන්න. (ලකුණු 5)

08) i)

| | ශිෂ්ඨාචාරයේ නම | හඳුන්වන වෙනත් නමක් | ආශ්‍රිත ගංගාව |
|---|---|---|---|
| 1) | මෙසපොතේමියාව | ............(A)............ | ............(B)............ |
| 2) | ............(C)............ | මිසර | ............(D)............ |
| 3) | ඉන්දු නිම්න | ............(E)............ | ............(F)............ |
| 4) | හොවැංහෝ | ............(G)............ | ............(H)............ |

A - ........................................ B - ........................................

C - ........................................ D - ........................................

E - ........................................ F - ........................................

G - ........................................ H - ........................................

(ලකුණු 2)

ii) නයිල් නිම්න ශිෂ්ඨාචාරයේ හා මෙසපොතේමියානු ශිෂ්ඨාචාරයේ අකුරු ලිවීමට භාවිතා කල දේවල් 2 ලියන්න. (ලකුණු 4)

iii) ජනාවාස වීම පාඩමට අදාලව ගල් යුගයේ මිනිසාගේ ජන ජිවිතය පිළිබ.ව චිත්‍රයක් අදින්න. (ලකුණු 4)

********